# කැලණිය විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

## ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය)
## බාහිර උපාධි පාඨමාලාව

# ශිෂ්‍ය අත්පොත


**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

**කැලණිය**

**www.cdce.kln.ac.lk**

සංශෝධිත දෙවන මුද්‍රණය - 2022

**මෙහි අන්තර්ගත විභාග නීතිරීති රෙගුලාසි කැලණිය විශ්වවිද්‍යාලය සතු වන අතර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ලිඛිත අවසරයකින් තොරව උපුටා ගැනීම, මුද්‍රණය කිරීම සපුරා තහනම් වේ.**

**සංස්කරණය** - **අධ්‍යක්ෂ**
*ආචාර්ය පූජ්‍ය ඩී. ධම්මදස්සි හිමි*

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
*එස්. මනිවන්නන්*

**සහකාර මූල්‍යාධිකාරී**
*එස්.සී. වික්‍රමනායක*

**සෝදුපත් බැලීම** - **නියෝජ්‍ය අධ්‍යක්ෂ**
*පූජ්‍ය උඩවෙල රේවත හිමි*

**පිටකවරය** - **නියෝජ්‍ය අධ්‍යක්ෂ**
*දර්ශන මාපා සෝමරත්න*

**පරිගණක සංයෝජනය** - *කනිල් සංඛ තරංග*

ප්‍රකාශනය :

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*
*කැලණිය විශ්වවිද්‍යාලය*
*කැලණිය*

# ශිෂ්‍ය අත්පොත

## ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි පාඨමාලාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## කැලණිය විශ්වවිද්‍යාලය

පණ්ඩිතාචාර්ය රත්මලානේ ධර්මාලෝක මාහිමියන් විසින් 1875 නොවැම්බර් මස පළමුවන දින ආරම්භ කළ පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවනින් 1959 සැප්තැම්බර් මස 17 වන දින විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් සරසවියක් බිහි වන්නේ දේශීය අධ්‍යාපනය නගා සිටුවීමේ ප්‍රශස්ත සංකල්පයත් නූතන ලෝකයට අවශ්‍ය ශාස්ත්‍ර ගවේෂණයෙහි යෙදෙන ප්‍රාමාණික විද්වතුන් බිහි කිරීමේ උදාර අභිලාෂයත් පෙරදැරි කරගෙන ය. යථෝක්ත විද්‍යාලංකාර පිරුවෙන්හි පරිවේණාධිපති කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමියන් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති ස්වාමින් වහන්සේ ලෙස පත් වූහ. කැලණිය විශ්වවිද්‍යාලය මගින් දශක හයකට අධික කාල පරිච්ඡේදයක් තුළ ශබ්ද ශාස්ත්‍රාදියෙහි ප්‍රගමනය උදෙසා කළ විශිෂ්ට මෙහවර නිසා ම එය දෙස් විදෙස් වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වී ඇති සරසවිය බව සඳහන් කළ යුතු ය. සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ධර්මාරාම මාහිමි, පණ්ඩිත ශිරෝමණී ලුණුපොකුනේ ධම්මානන්ද මාහිමි, පණ්ඩිතාචාර්ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමි, සාර්වභෞම පණ්ඩිත යක්කඩුවේ පඤ්ඤාරාම නාහිමි, පණ්ඩිතාචාර්ය නාත්තණ්ඩියේ පඤ්ඤාකර නාහිමි, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමි යන පරිවේණාධිපති වහන්සේලා මෙම ශාස්ත්‍ර නිකේතනයේ අභිවෘද්ධිය පිණිස මහඟු මෙහවරක් ඉටු කළ යතීන්ද්‍රයන් වහන්සේලා අතර ප්‍රධාන වෙති.

1972 අංක 01 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පනත මගින් ශ්‍රී ලංකාවේ සියලු ම විශ්විද්‍යාලය එක ම විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබුණු අවස්ථාවේ දී 1972 පෙබරවාරි 15 වන දින සිට මෙම විශ්වවිද්‍යාලය **"ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය"**

බවට පත් විය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාලය පනතින් 1978 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ව්‍යූහය වරක් සංශෝධනය කරනු ලැබුණු අවස්ථාවේ දී යථෝක්ත මණ්ඩපය **"කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව"** ලෙසින් නැවත වරක් ස්වායත්ත විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබිණ. 1958 පනත අනුව ආරම්භයේ දී ගිහි පැවිදි ශිෂ්‍යයන් පමණක් ඇතුළත් කරගනු ලැබුණු මෙම ආයතනයට, 1966 අංක 20 දරන, ජාතික උසස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරනු ලැබීමත් සමග ම ශිෂ්‍යාවන් ද ඇතුළත් කරගත හැකි විය. ආරම්භයේ දී පැලියගොඩ පිරිවෙන් භූමියෙහි ම පිහිටවනු ලැබුණු මෙම විශ්වවිද්‍යාලය ඉඩකඩ මඳ වීම නිසා නොබෝ කලකින් වෙනත් භූමි භාගයකට ගෙන යාමේ අවශ්‍යතාව පෙනෙන්නට විය. ඒ අනුව දැනට විශ්වවිද්‍යාලය පිහිටුවා තිබෙන මෙම භූමි භාගයට 1975 වන විට විශ්වවිද්‍යාලයේ සියලු ම අංශ ගෙන එනු ලැබිණ. මෙම විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබුණු 1959 දී එය ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර, භූගෝල විද්‍යාව, බෞද්ධ අධ්‍යයන හා දර්ශනය, ආර්ථික විද්‍යාව, ගණිතය හා අධ්‍යාපන විද්‍යාව වැනි විෂය කිහිපයකට පමණක් සීමා වුව ද අද එය මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, විද්‍යා, වෛද්‍ය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පරිගණක තාක්ෂණය සහ පශ්චාද් උපාධි අධ්‍යයන වශයෙන් හැඳින්වෙන පීඨ හතකින් සහ අධ්‍යයන අංශ 44 කින් සමන්විත වූ, ඊට අදාළ විෂය සම්භාරයක් පිළිබඳ උපාධි අධ්‍යයන, පශ්චාද් උපාධි අධ්‍යයන හා පර්යේෂණ කාර්යයෙහි නිරත කීර්තිමත් විශ්වවිද්‍යාලයක් බවට පත්ව ඇත.

## කැලණිය විශ්වවිද්‍යාලයීය ගීතය

සිය දෙස කිතු ගොස
උරුමය සුරකින
සියත් සුවඳ විදු කිරණ බෙදා දෙන
සරා සඳකි විදුලකර උදාගිර
කැලණිය සරසවි මාතා..........//

සතර සයුර වී - දූයට නුවණ දෙන
සත් සිළුමිණ වී - ඉසුරු සදාලන
දූයේ ජීව උල්පත වන් නොසිඳෙන
කැලණිය සරසවි මාතා..........//

සුනිසිත සුවියත් පිවිතුරු නැණ ගුණ
යුගයෙන් යුගයට දූයට තිළිණ කර
තරු පිරිවර සහ මුළු ලොව සරසන
කැලණිය සරසවි මාතා.......
විදු අඹරේ බැබලේවා.......

සිය දෙස කිතු ගොස..........//

*පද රචනය*
මහාචාර්ය දර්ශන රත්නායක

**සංගීතය සහ තනු නිර්මාණය**
කලාකීර්ති රෝහණ වීරසිංහ

# පටුන


■ උපකුලපති පණිවුඩය 9-11

■ අධ්‍යක්ෂ පණිවුඩය 12-14

**1. බාහිර උපාධි පාඨමාලා ප්‍රවේශය 15-18**

1.1 බාහිර උපාධි කටයුතු හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය බල මණ්ඩලය

1.2 කැලණිය විශ්වවිද්‍යාල නිලධාරීහු

1.3 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිලධාරීහු

1.4 පාඨමාලාවලට අදාළ පීඨවල, අධ්‍යයන අංශය හා දුරකථන අංක

**2. පාඨමාලා ඒකක ක්‍රමය 18-20**

2.1 ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

2.2 විෂය ඒකක

**3. ලියාපදිංචිය 20-25**

3.1. ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

3.2 ලියාපදිංචි අංකය

**4. විභාග පටිපාටිය 25-37**

4.1. පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර

4.2 විභාග පැවැත්වීමේ ක්‍රමවේදය

4.3. උපාධි ප්‍රදානය සඳහා නිර්ණායක හා ප්‍රතිඵල නිර්ණය කිරීම

4.4 විභාග නීති රීති

4.5 විභාග අක්‍රමිකතා

4.6 පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍ර

5. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම 37-38
5.1 විභාග ප්‍රතිඵල අත්හිටුවීම/තහනම් කිරීම

6. ගාස්තු 38-40
6.1 පාඨමාලා ගාස්තු

7. අයදුම්පත් කැඳවීම 40-41

8. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම 41-42
8.1 අත්පත්‍රිකා/මාර්ගෝපදේශ ග්‍රන්ථ
8.2 උපාධි පරීක්ෂණ සඳහා සම්මන්ත්‍රණ
8.3 ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය (LMS)
8.4 පසුගිය ප්‍රශ්නපත්‍ර

9. සහතිකපත්‍ර නිකුත් කිරීම 43-44

10. වෙනත් කරුණු 45-47

11. බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි 48

## උපකුලපති පණිවුඩය

ප්‍රිය සිසු දරුවනි,

ලොව ජනිත වන මානවයන්ගේ සමාජ සංපර්කය හේතු කොටගෙන රැස්කර ගන්නා දැනුම් සම්භාරය එකී දේශයෙහි සෑම අංශයක ම ප්‍රගමනයට හේතු වන බව පැහැදිලි කරුණකි. එකී දැනුම් සම්භාරය මානව සමාජයේ අභිවෘද්ධිය පිණිස මනා කළමනාකරණයකින් භාවිත කිරීමට ඔවුන් සතුව පවතින ප්‍රඥාව මැනවින් ඉවහල් වේ.

එසේ ම එකී දැනුමත් ප්‍රඥාවත් හේතු කොටගෙන ගන්නා තීරණ ලෝකයේ යහ පැවැත්මට හේතු වන්නේ මානවධර්මතා නම් උත්තරීතර ගුණය මුල් කොටගෙන බව ලෝක ඉතිහාසය මධ්‍යස්ථ ව නිරීක්ෂණය කිරීමෙන් මනාව අවබෝධ වේ. දැනුම අවශ්‍ය වන්නේ ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට ය. පරිපූර්ණ විද්‍යාර්ථියකු බිහි කිරීමට දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. දෛනික ව මිනිසා මුහුණදෙන ගැටලු රාශියක් ද ඇත. එම ගැටලුවලට ඇත්තේ පිළිතුරු නොවේ. ගැටලුවලට ඇත්තේ විසඳුම් ය. එය දැනුමෙන් පමණක් විසඳාගත නොහැකි ය. එහි දී මහෝපකාරී වන්නේ ප්‍රඥාවයි. එම නිසා දැනුමත් ප්‍රඥාවත් දෙකින් ම සරසවි විද්‍යාර්ථියා පෝෂණය විය යුතු ය. මුලින් සඳහන් කළ පරිදි ම දැනුම හා ප්‍රඥාව මානව ධර්මයන් සමග සංකලනය වීමෙන් අර්ථ සම්පන්න විද්‍යාර්ථියකු බිහිකර ගත හැකි ය. එම නිසා දැනුම කුසලතා හා ආකල්පවලින් පරිපූර්ණ ප්‍රාමාණික විද්‍යාර්ථියකු බිහි කිරීම අපගේ එක ම බලාපොරොත්තුව බව විශේෂයෙන් ම සඳහන් කරමි.

ඔබ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ලබන කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ කීර්තිමත් ඉතිහාසයක් තිබෙන විශිෂ්ට අධ්‍යාපන ආයතනයකි. පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනින් 1959 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් ආරම්භ ව පසු ව විද්‍යාලංකාර මණ්ඩපය නමින් ද වර්තමානයෙහි

කැලණිය විශ්වවිද්‍යාලය නමින් ද හඳුන්වන ලබන මෙම සරසවියෙහි ආරම්භය විද්‍යාලංකාර පිරිවෙනේ ආරම්භය දක්වා ඈතට දිව යයි. 1875 නොවැම්බර් 01 වන දින රත්මලානේ ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ආරම්භ කළ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන 19 වන සියවසෙහි දෙවන අර්ධයෙහි පහළ වූ පෙරදිග අධ්‍යාපනයේ විශිෂ්ට තක්ෂිලාවක් ලෙස පෙර අපර දෙදිග වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වූ විද්‍යා ස්ථානයක් බව සඳහන් කරන්නේ සාඩම්බර හැඟීමෙනි.

1993 වර්ෂයේ කලා සහ වාණිජ පාඨමාලාවලින් පමණක් ආරම්භ වූ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා, 1999 වසර වන විට විද්‍යාවේදී සහ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි පාඨමාලා සහිත ව පවත්වාගෙන යාමට හැකි වූයේ ශීඝ්‍ර ප්‍රගතියක් ප්‍රදර්ශනය කරමිනි. වර්තමානය වන විට දහස් ගණනක සිසුන්ගේ ප්‍රාර්ථනා ඉටු කෙරෙන අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙම ආයතනය පත්ව තිබෙන බව පවසනුයේ හද පිරි සතුටිනි.

බාහිර උපාධි අපේක්ෂකයකු වශයෙන් ආයතනයට බැඳුණ දා සිට උපාධිධාරියකු වශයෙන් සමාජයට අනුයුක්ත කරනු ලබන දින දක්වා අවශ්‍ය සියලු කටයුතු නිරවුල් ව සහ සාර්ථක ව මෙම ආයතනයෙන් සිදුකර ගැනීමේ හැකියාව ලැබීම ඔබ ලද භාග්‍යයකි. විශේෂයෙන් ම සාම්ප්‍රදායික රාමුවෙන් බැහැරව රැකියා වෙළඳපොළ අරමුණු කරගත් පාඨමාලා මගින් උගත්, බුද්ධිමත් පරපුරක් සමාජයට මුදා හැරලීමේ හැකියාව අපට හිමි වූයේ, නව විෂයමාලා හඳුන්වා දෙමින් ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රයයන් උපාධි පාඨමාලාවන්ට අන්තර්ගත කරලීමට හැකි වූ නිසා ය. එහි උපරි ම පල නෙළා ගැනීමේ යුතුකම මෙන්ම වගකීම ද ඔබ සතු වන බව මේ අවස්ථාවේ දී සිහිපත් කරමි.

කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ඔබ ලියාපදිංචි වන්නේ යම් දිනක දී ද එදින සිට ඔබ උපාධිලාභියකු වන දින දක්වා සියලු කටයුතු අන්තර්ජාලය ඔස්සේ සිදු කිරීම ඔබ ලද ජයග්‍රහණයකි. ඒ මගින් ඔබ ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන පුද්ගලයකු වශයෙන් පමණක් නොව, නවීන ලෝකය සමග නව දැනුමෙන් කටයුතු කළ හැකි අයෙකු බවට ද නිරායාසයෙන් ම පත් වෙයි. අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට නොහැකිව ඉච්ඡාභංගත්වයට පත් වූ සිසුන් එකී මානසික තත්ත්වයෙන් දුරස් කරලීමට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමත් වූ බව දීර්ඝ කාලයක් පුරාවට අප විසින් බිහි කරනු ලැබූ උපාධිධාරීන් ප්‍රබල සාධකයකි.

බාහිර උපාධි පාඨමාලා සම්බන්ධයෙන් විවේචනාත්මක අදහස් ඉදිරිපත් වන මෙවන් යුගයක, එකී අදහස් නිස්සාර වූවක් බවට පත් කරලීමේ හැකියාව ලැබුණේ කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් නවීන තාක්ෂණය භාවිත කරමින් විද්‍යාර්ථීන්හට ඉගෙනුම් ක්‍රියාවලියට අවශ්‍ය වන පහසුකම් සැලසීම හේතු කොටගෙන ය. මෙම සියලු ක්‍රමවේදයන්වල නිසි ප්‍රයෝජන ලබා ගැනීමේ වගකීම ඔබ සතු වන බව ද අමතක නොකළ යුතු ය.

කැලණිය විශ්වවිද්‍යාලය සතුව පවතින්නා වූ කීර්තිමත් නාමය එලෙසින් ම ආරක්ෂා කරමින් ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථක ව ඉටු කරගෙන රටෙහි, ජාතියෙහි හා ශබ්දශාස්ත්‍රාදියෙහි ප්‍රගමනය උදෙසා නිරන්තරයෙන් ම ඔබ කැපවිය යුතු ය. ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**උපකුලපති**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**

## අධ්‍යක්ෂ පණිවුඩය

**ප්‍රිය විද්‍යාර්ථීනි,**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛන අංක 932/2010, 20/2017 හා 01/2021 අනුව සකස් කරන ලද ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය/විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය/ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය/වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය යන විෂය නිර්දේශයන්ට අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017 වසරේ දී අත්හිටුවන ලද, ශිෂ්‍ය ලියාපදිංචිය නැවත සිදු කරන ලෙසට දැනුම් දී ඇත. ඒ ක්‍රමවේදයට අනුව 2019 අධ්‍යයන වර්ෂයෙහි සිට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ උපාධි බාහිර පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කරනු ලැබේ.

වසරින් වසර ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙන් බිහිවන බාහිර උපාධිධාරීන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම නිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයවලට අභ්‍යන්තර ව බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් බඳවා ගැනීමටත් විෂයයන් කිහිපයක් සඳහා විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වීම වළක්වා ලීම සඳහා එක් විෂයකට 25% ක් පමණක් උසස් පෙළ ඉසෙඩ් අගය (z.score) මත බඳවා ගන්නා ලෙසත් ඉහත චක්‍ර ලේඛන හා අංක මගින් දන්වා ඇත. ඒ අනුව සකස් කරන ලද නිර්ණායකයන්ට අනුව ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන බව ඔබ විසින් අවබෝධ කරගත යුතු ප්‍රධානතම කාරණයකි.

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් පිටුව ඔබට පහසුවෙන් පරිහරණය කළ හැකි පරිදි අලුතින් නිර්මාණය කොට ඇති අතර එයට පිවිසීමෙන් ශිෂ්‍ය අත්පොත/ප්‍රවේශ නිර්ණායක/විභාග

නිර්ණායක/ අතිරේක නීතිරීති වැඩි විස්තර සහිත ව බලාගත හැකි ය. එසේ ම වෙබ් පිටුවේ ඇති LMS පිටු/Zoom දේශන/Zoom සම්මන්ත්‍රණ දේශන හා ඉලෙක්ට්‍රොනික් පුස්තකාලය සඳහා ලියාපදිංචියෙන් පසු ඔබට ප්‍රවේශ විය හැකි ය.

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ඍජුව ම සිසුන් සමග සම්බන්ධතා පවත්වන ආයතනය වුවත් සියලු විෂය නිර්දේශ, ප්‍රවේශ හා විභාග නිර්ණායක ඇතුලු වෙනත් නීතිරීති, ප්‍රතිපත්ති සකස් කිරීම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, උත්තර පත්‍ර බැලීම හා ලකුණු ලේඛන ඇගයීම, විවිධ කාර්යයන් සඳහා ආචාර්යවරුන් පත් කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ විවිධ මණ්ඩල හා සභාවලින් සිදු වේ. එවා නම් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන මණ්ඩලය, පීඨ සභා, ප්‍රවේශ කමිටුව, අභියාචනා කමිටුව, විභාග අක්‍රමිකතා කමිටුව, නිල චාරිත්‍ර කමිටුව, විභාග අංශය, ශාස්ත්‍රීය අංශය, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව, සනාතන සභාව හා පාලක සභාවයි. ඒ අනුව දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ස්වාධීන අධ්‍යාපන ආයතනයක් නොව කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලනයට යටත් වූ ආයතනයක් ලෙසත්, අභ්‍යන්තර උපාධිධාරියෙකු බිහි කරන ආකාරයේ ම මැදිහත් වීමක් බාහිර උපාධිධාරීන් බිහිකරලීම සඳහා විශ්වවිද්‍යාලය මගින් සිදුකරන බවත් ඔබ විසින් තේරුම් ගතයුතු අත්‍යවශ්‍ය ම කාරණයකි. කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ බාහිර උපාධිය සඳහා ලියාපදිංචි වී උපාධිය අවසන් කර ගැනීමට නොහැකි වූ අතිවිශාල ශිෂ්‍ය පිරිසක් දැනට සිටින බව ඔබ දන්නා අතර ඔවුනගේ ප්‍රශ්න සාධාරණ ලෙස විසඳීමට දැනටමත් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. පැවැත්වීමට නොහැකි වූ විභාග අඛණ්ඩ ව පැවැත්වීම 2021 දෙසැම්බර් මස සිට ආරම්භ කොට ඇත. පැවැත්වූ සියලු විභාගවල ප්‍රතිඵල නිකුත් කොට ඇත. තව ද නියමිත කාලය ඉක්ම වූ හෝ අවසාන

වසර විභාගවලට පෙනී සිට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ විද්‍යාර්ථීන්ට අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කොට ඇත්නම් මානවශාස්ත්‍ර ඩිප්ලෝමාව/සමාජීයවිද්‍යා ඩිප්ලෝමාව/ වාණිජ විද්‍යාවේදී ඩිප්ලෝමාව/ ව්‍යාපාර කළමනාකරණවේදී ඩිප්ලෝමාව හෝ සම්භාර 60ක් සම්පූර්ණ කොට ඇත්නම්, මානවශාස්ත්‍ර උසස් ඩිප්ලෝමාව/සමාජීයවිද්‍යා උසස් ඩිප්ලෝමාව/ වාණිජ විද්‍යාවේදී උසස් ඩිප්ලෝමාව/ ව්‍යාපාර කළමනාකරණවේදී උසස් ඩිප්ලෝමාව විද්‍යාර්ථීන්ගේ ඉල්ලීම පරිදි ඉදිරියේ දී ලබා දීමට කටයුතු සැලසුම් කොට ඇත.

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් මෙතෙක් සිදු වූ අතපසු වීම් සියල්ල මග හරවා ගෙන අභිනව ප්‍රවිෂ්ට ඔබගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමට කටයුතු කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය, පීඨාධිපතිවරුන්, අංශාධිපතිවරුන් හා ආචාර්ය මණ්ඩලය ඇතුළු අප සැමගේ ඒකායන බලාපොරොත්තුවයි.

**අධ්‍යක්ෂ**
**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**

## 1. බාහිර උපාධි පාඨමාලා ප්‍රවේශය

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර, සමාජයීය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන සහ විද්‍යා පීඨවලට අදාළ ව බාහිර උපාධි පාඨමාලා ක්‍රියාත්මක වේ. 1993 වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) සහ වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාවන්ගෙන් පමණක් ඇරඹි මෙම ශාස්ත්‍රීය සේවාව 1999 වර්ෂයේ සිට ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය සහ විද්‍යාවේදී සාමාන්‍ය උපාධි පාඨමාලා දක්වා ව්‍යාප්ත කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු යොදන ලදී. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම් සලසා ඇත.

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**විද්‍යාවේදී වෘත්තීය චිකිත්සාව සාමාන්‍ය (බාහිර) උපාධිය**
**ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධිය**

උක්ත පාඨමාලා සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට අදාළ උපාධිය පිරිනැමීම දක්වා වූ සියලු කටයුතු අදාළ විධි විධානවලට යටත්ව පවත්වාගෙන යාම සිදුකරන ලද්දේ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය විසිනි. එහෙත් 2012 ජනවාරි මස 10 දින දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ආරම්භ වීමත් සමග එතෙක් බාහිර විභාග අංශය මගින් ඉටුකළ සියලු කාර්යයන් පිළිබඳ සම්පූර්ණ වගකීම දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය වෙත පවරා දෙනු ලැබී ය.

## 1.1 බාහිර උපාධි කටයුතු හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය බලමණ්ඩල

බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ සියලු අධ්‍යයන සහ පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව පවත්වා ගෙන යනු ලබන අතර, ඒ සම්බන්ධ ව කටයුතු කිරීමේ සියලු බලතල පහත සඳහන් බලමණ්ඩල වෙත පැවරී ඇත.

**පාලක සභාව**
**සනාතන සභාව**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව**
**ප්‍රවේශ කමිටුව**
**විභාග පරීක්ෂක මණ්ඩල**
**අභියාචනා කමිටුව**
**විභාග අක්‍රමිකතා කමිටුව**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන මණ්ඩලය**
**පීඨ සභා**
**අධ්‍යයන අංශ**

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට අදාළ උපාධි කටයුතු සම්බන්ධ සියලු නිර්දේශ අධ්‍යයන අංශ මට්ටමේ සිට ඉහළ මණ්ඩල වෙත ඉදිරිපත් කරනු ලබන අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව පමණක් එම නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 කැලණිය විශ්වවිද්‍යාල නිලධාරීහු

- ❖ කුලපති
- ❖ උපකුලපති
- ❖ පීඨාධිපති - මානවශාස්ත්‍ර පීඨය
- ❖ පීඨාධිපති - වෛද්‍යපීඨය
- ❖ පීඨාධිපති - විද්‍යාපීඨය
- ❖ පීඨාධිපති - වාණිජ හා කළමනාකරණ පීඨය
- ❖ පීඨාධිපති - සමාජීය විද්‍යාපීඨය
- ❖ පීඨාධිපති - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
- ❖ පීඨාධිපති - පරිගණක හා තාක්ෂණය පීඨය
- ❖ ලේඛකාධිකාරී
- ❖ පුස්තකාලයාධිකාරී
- ❖ මූල්‍යාධිකාරී

## 1.3 දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිලධාරීහු

- ❖ අධ්‍යක්ෂ
- ❖ නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඉගෙනුම් සම්පත්
- ❖ නියෝජ්‍ය අධ්‍යක්ෂ - ලියාපදිංචි හා විභාග
- ❖ නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුහුණු
- ❖ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
- ❖ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

## 1.4 පාඨමාලාවලට අදාළ පීඨය, අධ්‍යයන අංශය හා දුරකථන අංක

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

| ජවාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | සෘජු දුරකථන අංකය | දිගු දුරකථන අංක |
|---|---|---|
| පීඨාධිපති | 011 2917708 | 500 |
| පීඨ කාර්යාලය | 011 2903501 | 502/503/504 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 011 2903501 | 501 |
| ගණකාධිකරණ අධ්‍යයන අංශය | 011 2903551 | 551 |
| මූල්‍ය අධ්‍යයන අංශය | 011 2903554 | 554 |
| මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය | 011 2914483 | 602 |
| වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය | 011 2903578 | 578 |
| අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය | 011 2903624 | 624 |

## 2. පාඨමාලා ඒකක ක්‍රමය

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි, විද්‍යාවේදී/ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) සහ වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාවන් හැදෑරීම සඳහා ලියාපදිංචි වීම පිණිස ඒ ඒ පාඨමාලාවන්ට අදාළ ව මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ පාලක සභාව විසින් අනුමත කරන ලද සුදුසුකම් ඇති අයට පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වේ.

## 2.1 ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා අදාළ පාඨමාලා ඒකක වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් නිර්දේශ කොට ඇති අතර, අපේක්ෂකයන් විසින් එම නිර්දේශිත විෂයයන් සියල්ල හැදෑරිය යුතු වේ. උක්ත පාඨමාලාව සඳහා ලියාපදිංචි කරගන්නා අපේක්ෂකයන් වෙත අදාළ විෂයයමාලා පිළිබඳ සියලු විස්තර ලබා දීමට කටයුතු යොදා ඇත.

## 2.2 විෂය ඒකක

### ප්‍රථම වසර

| | |
|---|---|
| BMGT 18015 | කළමනාකරණ මූලධර්ම |
| BMGT 18025 | මූල්‍ය ගිණුම්කරණය |
| BMGT 18035 | ව්‍යාපාර නීතිය |
| BMGT 18045 | ව්‍යාපාර ගණිතය |
| BMGT 18055 | තොරතුරු තාක්ෂණය |
| BMGT 18065 | ව්‍යාපාරික ආර්ථික විද්‍යාව |
| BMGT 18075 | ව්‍යාපාර සන්නිවේදනය (Buisness Communication) |

### දෙවන වසර

| | |
|---|---|
| BMGT 28015 | අලෙවි කළමනාකරණය |
| BMGT 28025 | මානව සම්පත් කළමනාකරණය |
| BMGT 28035 | කළමනාකරණ ගිණුම්කරණය |
| BMGT 28045 | ව්‍යාපාර සංඛ්‍යානය |
| BMGT 28055 | කළමනාකරණ තොරතුරු පද්ධති |
| BMGT 28065 | සංවිධාන අධ්‍යයනය |

**තෙවන වසර**

| | |
|---|---|
| BMGT 38015 | උපායශීලී කළමනාකරණය |
| BMGT 38025 | නවෝත්පාදන සහ ව්‍යාවසායකත්වය |
| BMGT 38035 | සංකාර්ය කළමනාකරණය |
| BMGT 38045 | සංවිධාන චර්යාව කළමනාකරණය |
| BMGT 38055 | ආයතනික විශිෂ්ටත්වය සඳහා තත්ත්වය |
| BMGT 38065 | මූල්‍ය කළමනාකරණය |

**BMGT 18075 හර විෂයක් වන අතර ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) ගණනය කිරීම සඳහා අදාල කරගනු නොලැබේ.**

## 3. ලියාපදිංචිය

### 3.1 ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

එක් එක් පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම් පිළිබඳ සියලු විස්තර මතු දක්වෙන අතර, අදාළ සුදුසුකම් සපුරා නොමැති කිසිම අපේක්ෂකයෙකු ලියාපදිංචි වීම සඳහා අයදුම් නොකළ යුතු ය.

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් මතු දැක්වෙන සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වේ.

#### 3.1.1 අ.පො.ස. උසස් පෙළ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් අනුමත විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම. ලියාපදිංචි වීමේ දී වාණිජ විෂය ධාරාව යටතේ අනුමත විෂයයන් හදාරා ඇති අයට ප්‍රමුඛතාව හිමිවේ.

### **3.1.2** NVQ

ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ දැක්වෙන යෝග්‍යතා මට්ටම් තුන, විශ්වවිද්‍යාල මට්ටම් එක සඳහා අවශ්‍ය ශ්‍රී ලංකා යෝග්‍යතා මට්ටම් දෙකට අදාළ (SLQF Level - 02) සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට (NVQ Level - 5, Advanced Certificate) ලියාපදිංචි වීමට අයදුම් කළ හැකි ය.

වැදගත්

***මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශවලට සම්බන්ධ සේවයේ නියුතු අයෙකු අදාළ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට අයදුම් කරන අවස්ථාවල දී ඔහු/ඇය සේවය කරන දෙපාර්තමේන්තුවලට සම්බන්ධ විෂයයන් තෝරා නොගන්නා බවට ප්‍රකාශයක් අදාළ අංශප්‍රධානගේ නිර්දේශය ද සහිත ව ඉදිරිපත් කළ යුතු ය.***

### **3.1.3 වෙනත් සුදුසුකම්**

කැලණිය විශ්වවිද්‍යාලය මගින් අනුමත කොට ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ලබා ඇති අයට ද ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අයදුම් කළ හැකි ය.

i. විශ්වවිද්‍යාලයීය උසස් සහතික පත්‍ර පාඨමාලාව සමත් වී තිබීම.

ii. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතික පත්‍රය හෝ අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු ඩිප්ලෝමා සහතිකය.

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

iv. පිරිවැය හා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම.

v. ශ්‍රී ලංකා යුද්ධ, නාවික, ගුවන් හමුදාවේ හෝ පොලිසියේ ස්ථිර බලකායක අධිකාරිලත් නිලධාරියකු වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

vi. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වන පන්තියට බඳවා ගැනීමේ සීමිත විභාගයෙන් සමත් වී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී සිටින නිලධාරියෙකු වීම.

vii. ලන්ඩන් උසස් පෙළ පරීක්ෂණයෙන් සමත් වීම.

viii. ලන්ඩනයේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරීත්ව ආයතනයෙන් හෝ සහතිකලත් සහ සංස්ථාපිත ගණකාධිවරුන්ගේ සංගමයෙන් පවත්වන I, II, III, පරීක්ෂණවලින් සාමාර්ථ්‍යය ලබා තිබීම.

ix. ලන්ඩන් බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

x. එක්සත් රාජධානියේ සමාගම් සහ වාණිජ්‍යමය ගණකාධිකාරිවරුන්ගේ සමාජයේ සාමාජිකත්වය.

xi. බ්‍රිතාන්‍යයේ කළමණාකාරිත්වය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

xii. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරිත්වයේ අවසාන පරීක්ෂණය සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී තිබීම.

xiii. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකත්වය.

xiv. රජයේ හෝ පෞද්ගලික ආයතනයක විධායක මට්ටමේ කළමනාකරණ පළපුරුද්ද.

මීට අමතර ව කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය සහ සනාතන සභාව මගින් අනුමත කරන වෙනත් සුදුසුකම් ඇති අයට අදාළ පාඨමාලාව සඳහා අයදුම්කිරීමට ඉඩ සලසා ඇති අතර, ඒ පිළිබඳ සනාතන සභා තීරණය අවසන් තීරණය වේ.

### 3.1.4 වයස් සීමාව

බාහිර උපාධි සඳහා අදාළ ලියාපදිංචි වීමට වයස අවු. 18 ට වැඩි අයට පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉල්ලා සිටින ඕනෑ ම අවස්ථාවක දී ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු ය.

### 3.2 ලියාපදිංචි අංකය

උපාධි පාඨමාලා සඳහා බාහිර ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි කර ගනු ලබන සෑම ශිෂ්‍යයෙකු වෙත ම ලියාපදිංචි අංකයක් නිකුත් කරනු ලැබේ. කිසියම් අපේක්ෂකයකු බාහිර විභාග සම්බන්ධයෙන් කරනු ලබන සෑම විමසීමක දී ම තම ලියාපදිංචි අංකය සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

### 3.2.1 ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපිය සහ ශිෂ්‍ය හැඳුනුම්පත

ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන සෑම අයදුම්කරුවෙක් වෙත ම ඔහු/ඇය අදාළ බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ඇති බව තහවුරු කරන ලිපියක් (අදාළ විස්තර ඇතුළත් කොට) ද සමගින් බාහිර ශිෂ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ.

### 3.2.2 ලියාපදිංචියේ වලංගුතාව

ප්‍රථම ලියාපදිංචියෙන් පසුව ද සෑම අධ්‍යයන වර්ෂයක් සඳහා ම නියමිත ගාස්තු ගෙවා තම ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීමට අපේක්ෂකයන් කටයුතු කළ යුතු වේ. එසේ ලියාපදිංචිය දීර්ඝ කරගත හැකි උපරිම කාලය උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම හෝ මුල් ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ හතක (07) කාලයක් සම්පූර්ණ වීම යන දෙකින් පළමුව එළඹෙන දිනෙන් අවසන් වේ. අභියාචනා මගින් වසර 10 දක්වා දිර්ඝ කරගත හැකි ය.

### 3.2.3 ලියාපදිංචිය දීර්ඝ කිරීම

සිය ලියාපදිංචි කාලසීමාව ඉකුත්වී ඇති අපේක්ෂකයෙකුට කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. එබැවින් තම ලියාපදිංචි කාලසීමාව ඉකුත්වීමට පෙර අවශ්‍යතාව පරිදි එය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කිරීම අදාළ අපේක්ෂකයාගේ වගකීම වේ. පරීක්ෂණ සඳහා අයදුම් කරන අවස්ථාවල දී ලියාපදිංචිය දීර්ඝ කිරීම සම්බන්ධ උපදෙස් ලබාගත හැකි ය. සෑම ලියාපදිංචියක් ම වසරක කාලයට පමණක් වලංගු වේ.

### 3.2.4 ලියාපදිංචිය අවලංගු කිරීම

(අ). ලියාපදිංචි බාහිර උපාධි අපේක්ෂකයකුට තම අභිමතය පරිදි ඕනෑ ම අවස්ථාවක දී සිය ලියාපදිංචිය අවලංගු කරවා ගත හැකිය.

**<u>එවැනි අවස්ථාවක දී අදාළ ගාස්තු ආපසු ලබා දෙන ලෙස ඉල්ලීමට අපේක්ෂකයෙකුට අයිතියක් නොමැත.</u>**

පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින හෝ විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට නියමිතව ඇති අපේක්ෂකයකු විසින් ලියාපදිංචිය අවලංගු කරවා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

සිය ලියාපදිංචි කාලසීමාව අවසන් වීමට පෙර අවශ්‍යතාව පරිදි එය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකරන අපේක්ෂකයන්ගේ ලියාපදිංචිය ස්වයංක්‍රියව ම අවලංගු වන අතර, එවැනි අයෙකු නැවත ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් ලියාපදිංචි වීමේ පරිපාටියට අනුව නව අයදුම්පත්‍රයක් ඒ සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

### 3.2.5 මාධ්‍ය සංශෝධනය කිරීම

ලියාපදිංචි භාෂා මාධ්‍ය වෙනස් කිරීමට සෑම ආපේක්ෂකයෙකුට ම එක් අවස්ථාවක් ලැබෙන අතර එය ආයතනයේ ලියාපදිංචිය අවසන් වූ දිනයේ සිට මාසයක් ඇතුළත සිදු කර ගත යුතු වේ. ඉන් පසු කුමන හෝ හේතුවක් මත විෂය හෝ භාෂා මාධ්‍ය වෙනස් කළ නොහැකි ය.

## 4. විභාග පටිපාටිය

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සියලුම බාහිර උපාධි පාඨමාලාවන් සඳහා අදාළ පරීක්ෂණ ඒ ඒ අධ්‍යයන වර්ෂ අවසානයේ දී පැවැත්වීමට විධි විධාන යොදා ඇත. මුල් ලියාපදිංචියේ සිට වසරක කාලයක් ගතවීමෙන් පසුව ඒ ඒ පාඨමාලාවන්ට අදාළ ප්‍රථම පරීක්ෂණවලට අපේක්ෂකයන් පෙනී සිටිය යුතු ය. අනතුරුව එළඹෙන වර්ෂවල දී ද්විතීය සහ තෘතීය පරීක්ෂණ සඳහා පිළිවෙළින්

පෙනී සිටිය හැකි වේ. එසේ ම අනතුරුව එළඹෙන වර්ෂවල දී පූර්ව වර්ෂවල අසමත්වන හෝ ඌන සාමර්ථ්‍යයන් ලබන විෂයයන් සඳහා නැවත පෙනී සිටීමට ද අපෙක්ෂකයන්ට අවසර දෙනු ලැබේ.

එහෙත් සෑම ලියාපදිංචි අපේක්ෂකයකු විසින් ම එළඹෙන සෑම වර්ෂයක් සඳහා ම නියමිත ගාස්තු ගෙවා තම ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීමට වග බලා ගත යුතු අතර, එසේ ලියාපදිංචිය දීර්ඝ කරවා ගත හැකි උපරිම කාලය අවසන් වීමට පෙර තම උපාධි පාඨමාලාව අවසන් කර ගැනීමට ද වග බලා ගත යුතු වේ.

### 4.1. පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර

සෑම පරීක්ෂණයක් ම ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර, අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු අපේක්ෂකයන් වෙත පරීක්ෂණය සඳහා අදාළ ප්‍රවේශපත්‍ර අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. නියමිත කාලසීමාව තුළ එවැන්නක් බාගත කර ගැනීමට නොලැබුණහොත්, ඒ බව දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත දැනුම් දී අනතුරුව අනුපිටපතක් ලබා ගත හැකි ය.

### 4.2 විභාග පැවැත්වෙන ක්‍රමවේදය

කැලණිය විශ්වවිද්‍යාලය තීරණය කරණ පරිදි විද්‍යාර්ථීන් විභාග ශාලාවලට කැඳවා හෝ මාර්ගගත ක්‍රමයට විභාග පැවත්වීම සිදු කරනු ලැබේ.

### 4.2.1 පාඨමාලා ඒකක ඇගයීම

සෑම පාඨමාලා ඒකකයක් ම ඇගයීමට ලක් කර ශ්‍රේණි ප්‍රදාන කෙරේ. පාඨමාලා ඒකක ඇගයීම පහත සඳහන් ක්‍රමවලින් එකකට හෝ කිහිපයකට හෝ අනුව සිදුවිය හැකි ය.

i. ලිඛිත විභාග (Examination)
ii. මූලාශ්‍රය පරිශීලන විභාග (Open Book Examination)
iii. වාර්තා (Reports)
iv වාචික පරීක්ෂණ (Oral Test)
v අඛණ්ඩ ඇගයීම් (Continuous Assessment)
vi පැවරුම් (Assignment)
vii මාර්ගගත ප්‍රශ්නාවලි (Online Quizzes)
viii පන්ති කාමර පරීක්ෂණ (In class Test)
ix ප්‍රස්තුතිකරණ (Presentation)
x ආයතනික පුහුණුව (Internship/ Work-Based training)

**4.2.2 ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය :-**

විෂයක් සඳහා ලබාගත් ලකුණු පහත සඳහන් පරිදි දොළොස් විධි ක්‍රමයකට ශ්‍රේණිගත කරනු ලැබේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය | ශ්‍රේණිගත අගය |
|---|---|---|
| 85-100 | A+ | 4.0 |
| 70-84 | A | 4.0 |
| 65-69 | A- | 3.7 |
| 60-64 | B+ | 3.3 |
| 55-59 | B | 3.0 |
| 50-54 | B- | 2.7 |
| 45-49 | C+ | 2.3 |
| 40-44 | C | 2.0 |
| 35-39 | C- | 1.7 |
| 30-34 | D+ | 1.3 |
| 25-29 | D | 1.0 |
| 00-24 | E | 0.0 |

යම් ශිෂ්‍යයෙක් විසින් පාඨමාලාවට අදාළ සියලු ම විෂය ඒකක සම්පූර්ණ කළ යුතු වන අතර, එසේ කිරීමට අපොහොසත් වන විෂය ඒකක සම්බන්ධයෙන් පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකරයි නම් එකී විෂය ඒකක සඳහා E ශ්‍රේණියක් දෙනු ලැබේ.

### 4.3 උපාධි ප්‍රදානය සඳහා නිර්ණායක හා ප්‍රතිඵල නිර්ණය කිරීම :-

#### 4.3.1 සාමාර්ථ්‍යය :-

විභාග අපේක්ෂකයකු විසින් පහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලුවහොත් ඔහුට/ඇයට ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධිය (බාහිර) ප්‍රදානය කරනු ලැබේ.

- ශ්‍රේණිගත ලකුණු සාමාන්‍යය (GPA) ගණනය සඳහා සලකා බලනු ලබන විෂය ඒකක ගණනින්, අවම වශයෙන් අධ්‍යයන සම්භාර 75ක් සඳහා C ශ්‍රේණිය හෝ ඊට ඉහළ ශ්‍රේණි සහ ඉතිරි අධ්‍යයන සම්භාර සඳහා D, D+, හෝ C- ශ්‍රේණි ලබාගත යුතු ය. කෙසේ වෙතත් එක් අධ්‍යයන වර්ෂයකට අධ්‍යයන සම්භාර 5කට වඩා D, D+, හෝ C- ශ්‍රේණි ලබා නොතිබීම.

- අවම ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය 2.00 වීම.

- ව්‍යාපාර සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි (BMGT 18075) විෂය ඒකක සඳහා C හෝ ඊට ඉහල ශ්‍රේණියක් ලබා තිබීම.

- අධ්‍යයන වර්ෂ 05 ක් තුළ අදාළ සියලු ම අවශ්‍යතා සපුරා තිබීම.

### 4.3.2 පන්ති සාමාර්ථ්‍යය

**A).** ප්‍රථම පන්ති ගෞරව සාමාර්ථ්‍යය

ප්‍රථම පන්ති ගෞරව සාමාර්ථ්‍යයක් ප්‍රදානය සඳහා විභාග අපේක්ෂකයාට පහත සුදුසුකම් තිබිය යුතු ය.

- ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) ගණනය සඳහා සලකා බලනු ලබන විෂය ඒකක ගණනින් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 45 කට A හෝ ඊට ඉහළ ශ්‍රේණි තිබීම සහ ඉතිරි සියලුම විෂයන් සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි තිබීම.

- අවම ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය 3.7 වේ.

- ව්‍යාපාර සන්නිවේදනය සඳහා (BMGT 18075) විෂයය ඒකකය සඳහා C හෝ ඊට ඉහල ශ්‍රේණියක් ලබා තිබීම.

- අධ්‍යයන වර්ෂ 03ක් තුළ අදාළ සියලු ම අවශ්‍යතා සපුරා තිබීම.

**B).** දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමාර්ථ්‍යය

දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමාර්ථ්‍යයක් ප්‍රදානය සඳහා විභාග අපේක්ෂකයාට පහත සුදුසුකම් තිබිය යුතු ය.

- ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) ගණනය සඳහා සලකා බලනු ලබන විෂය ඒකක ගණනින් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 80 සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි ද ඉන් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 45කට B හෝ ඊට ඉහළ ශ්‍රේණි තිබීම සහ ඉතිරි අධ්‍යයන සම්භාර සඳහා D, D+ හෝ C- ශ්‍රේණි ලබා තිබීම. කෙසේ වෙතත් එක් අධ්‍යයන වර්ෂයකට අධ්‍යයන සම්භාර 5කට වඩා D හෝ D+ හෝ C- ශ්‍රේණි ලබා නොතිබීම.

- අවම ශේණිගත ලකුණු සාමාන්‍ය 3.30 වීම.

- ව්‍යාපාර සන්නිවේදනය සඳහා (BMGT 18075) විෂයය ඒකකය සඳහා C හෝ ඊට ඉහල ශ්‍රේණියක් ලබා තිබීම.
- අධ්‍යයන වර්ෂ 03ක් තුළ අදාළ සියලු ම අවශ්‍යතා සපුරා තිබීම.

## C). දෙවන පෙළ (පහළ) ගෞරව සාමාර්ථ්‍යය

දෙවන පෙළ (පහළ) ගෞරව සාමාර්ථ්‍යයක් ප්‍රදානය සඳහා විභාග අපේක්ෂකයාට පහත සුදුසුකම් තිබිය යුතු ය.

- ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) ගණනය සඳහා සලකා බලනු ලබන විෂය ඒකක ගණනින් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 75 සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි ද ඉන් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 45කට B හෝ ඊට ඉහළ ශ්‍රේණි තිබීම සහ ඉතිරි අධ්‍යයන සම්භාර සඳහා D, D+ හෝ C- ශ්‍රේණි ලබා තිබීම. කෙසේ වෙතත් එක් අධ්‍යයන වර්ෂයකට අධ්‍යයන සම්භාර 5කට වඩා D හෝ D+ හෝ C- ශ්‍රේණි ලබා නොතිබීම.
- අවම ශේණිගත ලකුණු සාමාන්‍ය 3.00 වීම.
- ව්‍යාපාර සන්නිවේදනය සඳහා (BMGT 18075) විෂයය ඒකකය සඳහා C හෝ ඊට ඉහල ශ්‍රේණියක් ලබා තිබීම.
- අධ්‍යයන වර්ෂ 03ක් තුළ අදාළ සියලු ම අවශ්‍යතා සපුරා තිබීම.

### 4.3.3. පරීක්ෂණ සාමාර්ථ්‍යය

**(අ).** බාහිර උපාධි පාඨමාලාවලට සම්බන්ධ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකු ම එක ම වතාවක දී අදාළ පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව ඒ ඒ පරීක්ෂණවලට අදාළ ව තමන් පෙනී සිටි සියලු ම විෂයයන් හෝ පාඨමාලා ඒකකවලට අදාළ ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) ලබා සමත්වීමට සුදුසු මට්ටමක සිටින බව පරීක්ෂක

මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් එකී අපේක්ෂකයන් අදාළ පරීක්ෂණයෙන් සමත් වූ සේ සලකනු ලැබේ.

**(ආ).** කිසියම් පරීක්ෂණයකට අදාළ විෂයයකින්/පාඨමාලා ඒකකයකින් ඌන සාමර්ථ්‍යය/ප්‍රතිඌන සාමර්ථ්‍යය ලබා ඇති අපේක්ෂකයෙකු එකී ඌනතා සම්පූර්ණ කිරීමෙන් පසු ව පමණක් අදාළ පරීක්ෂණයෙන් සමත් වූ සේ සලකනු ලැබේ.

### 4.3.4. ඌන සාමාර්ථ්‍යය

කිසියම් පරීක්ෂණයක දී අදාළ නිර්ණායකවලට අනුව එම පරීක්ෂණවලින් සමත්වීම සඳහා අවශ්‍ය ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) ලබා නොගන්නා එහෙත් නිර්දේශිත විෂය ඒකක සංඛ්‍යාවකට පමණක් සාමර්ථ්‍යය සඳහා අදාළ ලකුණු සාමාන්‍යය ලබා ඇති අපේක්ෂකයන් අදාළ පරීක්ෂණවලින් ඌන සාමර්ථ්‍යය ලැබූ අය ලෙස සැලකේ.

### 4.3.5. අසමත්වීම

අදාළ පරීක්ෂණවලින් සමත් වීමට හෝ ඌන සාමර්ථ්‍යයක් ලැබීමට හෝ අදාළ අවශ්‍යතා සම්පූර්ණ නොකරන සියලු අපේක්ෂකයන් අදාළ පරීක්ෂණවලින් අසමත් වූ අය සේ සැලකේ.

### 4.3.6 ඌනතා සම්පූර්ණ කිරීම

අවසාන උපාධි පරීක්ෂණවලට ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකු ම ඊට ප්‍රථමයෙන් හෝ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් වන වර්ෂයේ ම හෝ තම උපාධි පාඨමාලාවට අදාළ පූර්ව පරීක්ෂණවල ඌනතාවන් ඇතොත් ඒ සියල්ල සම්පූර්ණ කර තිබීම අත්‍යවශ්‍ය වේ. තව ද, අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිට සාමාන්‍ය/විශේෂ උපාධියක් නම්, අනතුරුව එළඹෙන වසර දෙක තුළ දී සිය ලියාපදිංචි

කාලසීමාව අඛණ්ඩ ව පවත්වාගෙන යාමට යටත්ව හා පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව තම උපාධි පාඨමාලාවට අදාළ ඌනතා සියල්ල සම්පූර්ණ කළ යුතු වේ. නියමිත කාලසීමාවන් තුළ අදාළ ඌනතා සම්පූර්ණ නොකරන කිසිම අපේක්ෂකයකු වෙත උපාධිය ප්‍රදානය කිරීම සඳහා කටයුතු කරනු නොලැබේ.

## 4.4 විභාග නීති රීති

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය සඳහා අපේක්ෂකයෙකු ගත කළ යුතු අවම කාලය අධ්‍යයන වර්ෂ තුනකි. ලියාපදිංචි වී අධ්‍යයන වර්ෂයක් සම්පූර්ණ වූ පසු ව්‍යාපාර කළමනාකරණවේදී ප්‍රථම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබන අතර, අනතුරුව එළඹෙන වර්ෂවල දී ව්‍යපාර කළමනාකරණවේදී ද්විතීය සහ තෘතීය පරීක්ෂණ සඳහා පිළිවෙළින් පෙනී සිට උපාධිය සම්පූර්ණ කළ හැකි ය.

### විභාගයට පෙනී නොසිටීම

(අ) සෑම විද්‍යාර්ථියකු ලියාපදිංචි වන සියලු ම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යයෙන් ම පෙනි සිටිය යුතු ය. කිසියම් පාඨමාලා ඒකකයකට පෙනී නොසිටීම පිළිබඳ ව විශ්වවිද්‍යාලයීය අභියාචනා මණ්ඩලයට පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකර විභාගයට පෙනී නොසිටියහොත් අදාළ විභාගයට නොපැමිණි වශයෙන් සඳහන් කරනු ඇත.

(ආ) විභාග අපේක්ෂකයෙකු පරීක්ෂණයට පෙනී සිටින සෑම අවස්ථාවක දී ම බාහිර විභාග අංශය මගින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රය, ශිෂ්‍ය හැඳුනුම්පත හා ජාතික හැඳුනුම්පත තමන් සතුව තබාගත යුතු වේ. විභාග ශාලාවක දී ඉල්ලා සිටින ඕනෑ ම අවස්ථාවක දී සිය ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට විභාග

අපේක්ෂකයන් බැඳී සිටින අතර, එසේ නොකරන අවස්ථාවල දී සිය විභාග අපේක්ෂකත්වය පවා අවලංගු කිරීමට ඉඩ ඇති බව සියලු විභාග අපේක්ෂකයන් තේරුම්ගත යුතු ය. විභාගයට පෙනී සිටින අතරතුර සිය ශිෂ්‍ය හැඳුනුම්පත නැති වුව හොත් නොපමාව බාහිර විභාග අංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී දැනුම්වත්කොට අවශ්‍ය උපදෙස් ලබාගත යුතු ය.

(ඇ) කිසියම් අපේක්ෂකයකු පරීක්ෂණයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටිය නොහැකි වන සේ රෝගාතුර වුවහොත් ඒ බව වහා ම බාහිර විභාග අංශය වෙත ලිඛිත ව දැනුම් දිය යුතු ය. රෝගාතුර වූ දින සිට ලිත් මසක් ඇතුළත ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකුගෙන් හෝ රජයේ රෝහලක විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් හෝ ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. මසක කාලය ඉකුත්වීමෙන් පසු ඉදිරිපත් කරන වෛද්‍ය සහතික ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) **අභියාචනා ඉදිරිපත් කිරීම**

නොවැළැක්විය හැකි හේතුවක් නිසා ප්‍රථම වරට විභාගයට පෙනී සිටීමට නොහැකි වු සිසුන්ට අභියාචනා ඉදිරිපත් වීම මඟින් ප්‍රථම වරට පෙනී සිටින අපේක්ෂකයෙකු ලෙස අදාළ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ඇත. ඒ සඳහා අභියාචනා කමිටුවට පිළිගත හැකි හේතු පැහැදිලි කරමින් ලිපියක් ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශ ලබා ගත යුතු ය. අසමත් වූ විෂය ඒකක සඳහා මෙය වලංගු නොවේ.

**(ඉ) අසමත් වූ විෂයන් සඳහා නැවත පෙනී සිටීම**

කිසියම් පාඨමාලා ඒකකයට C ශ්‍රේණියට පහළ අසමත් ශ්‍රේණි (C-/D+/D/E) ලබාගත් විද්‍යාර්ථියකුට උපරිම වශයෙන් C ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා නැවත විභාගයට පෙනී සිටිය හැකි ය. මෙහි දී විද්‍යාර්ථියා ලබා ගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා ගත හොත් කලින් තිබූ ශ්‍රේණිය ම උපාධියට ගණනය කරනු ලැබේ.

**(ඊ) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය**

අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 5ක් ඇතුළත උපාධිය සම්පූර්ණ කළ යුතු අතර පන්ති සාමාර්ථ්‍යය ලබා ගැනීමේ දී එය අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3ක් විය යුතු ය. එසේ වුව ද අධ්‍යයන වර්ෂ 10ක උපරිමයකට යටත්ව අසමත් පාඨමාලා ඒකක සම්පූර්ණ කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.

විභාග පිළිබඳ වැඩිදුර උපදෙස් විභාග අයදුම්පත්‍රය සමග අපේක්ෂකයන් වෙත නිකුත් කරනු ලැබේ.

## 4.5 විභාග අක්‍රමිකතා

- ❖ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවල දී සටහන්, ලිපිලේඛන, ජංගම දුරකතන ආදිය විභාග ශාලාවට රැගෙන ඒම හා ඒවා ළඟ තබා ගැනීම හෝ භාවිත කිරීම.
- ❖ විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපිද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම.
- ❖ කොපිකිරීම, කොපිකිරීමට උදවු කිරීම හෝ ඒ සඳහා අනුබල දීම.

- ❖ වෙනත් අයෙකු නමින් පරීක්ෂණවලට පෙනී සිටීම.

- ❖ අසංවර හැසිරීම හා වෙනත් ඕනෑ ම ආකාරයක වංචනික ක්‍රියා.

විභාග පැවැත්වෙන අවස්ථාවල දී අපේක්ෂකයන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා ඔප්පු වුවහොත් පහත සඳහන් දඬුවම් එකක් හෝ කිහිපයක් නියම කිරීමට විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූල ව කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට බලය පැවරී ඇත. එසේ නියම කරනු ලැබිය හැකි දඬුවම් කිහිපයක් මෙසේ ය:

- ❖ **විභාග අක්‍රමිකතා සඳහා දූනට පනවා ඇති අවම දඬුවම වන්නේ වසර තුනක (03) කාලයක් දක්වා කිසිදු පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීමයි.**

ඊට අමතර ව පහත සඳහන් දඬුවම්වලින් එකක් හෝ කිහිපයක් නියම කිරීමට ද සනාතන සභාවට බලතල ඇත.

- ❖ අදාළ පත්‍රය/විෂය ඒකකය සඳහා වූ අපේක්ෂකත්වය හෝ විභාග අපේක්ෂකත්වය සම්පූර්ණයෙන් අවලංගු කිරීම.

- ❖ ලියාපදිංචිය අත්හිටුවීම/අවලංගු කිරීම.

- ❖ දඬයක් සහිත ව හෝ රහිත ව කිසියම් කාල සීමාවකට විභාගයට පෙනී සිටීම තහනම් කිරීම.

- ❖ විශ්වවිද්‍යාල සනාතන සභාව නියම කරනු ලැබිය හැකි වෙනත් දඬුවමකට යටත් කිරීම.

## 4.6 පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර

සෑම පරීක්ෂණයක් ම ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර, අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු අපේක්ෂකයන් වෙත පරීක්ෂණය සඳහා අදාළ ප්‍රවේශපත්‍ර අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. නියමිත කාලසීමාව තුළ එවැන්නක් බාගත කර ගැනීමට නොලැබුණහොත්, ඒ බව දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත දනුම් දී අනතුරු ව අනුපිටපතක් ලබා ගත හැකි ය.

### 4.6.1 පරීක්ෂණ සඳහා පෙනී සිටීම

(අ). අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට යටත්ව ලියාපදිංචි සෑම අපේක්ෂකයෙකු ම ඒ ඒ උපාධි පාඨමාලාවලට අදාළ වර්ෂාවසාන පරීක්ෂණවලට පෙනී සිටිය යුතු ය.

(ආ). පිළිගත හැකි වෛද්‍යහේතු මත අනුමැතිය දී ඇති අවස්ථාවල දී හැර සෑම අපේක්ෂකයෙකු ම තමා ලියාපදිංචි වූ සෑම විෂයයක් සඳහා ම එකවර පරීක්ෂණවලට පෙනී සිටිය යුතු ය.

(ඇ). පිළිගත හැකි වෛද්‍යහේතු මත පරීක්ෂණයට ඉදිරිපත් වීමට හෝ පරීක්ෂණය සම්පූර්ණ කිරීමට හෝ අපොහොසත් වන අපේක්ෂකයෙකුහට පන්ති සාමාර්ථ්‍යයක් පිරිනැමීම සලකා බලනු ලබන්නේ අදාළ පරීක්ෂණය සඳහා නැවත ඉදිරිපත් වීමට ලැබෙන ප්‍රථම අවස්ථාවේ දී ම සම්පූර්ණ පරීක්ෂණයට එකවර පෙනී සිට ගෞරව සාමාර්ථ්‍යයක් ලැබීමට සුදුසු මට්ටමකින් පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව එකී පරීක්ෂණයෙන් සමත් වී ඇති බව පරීක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන්නේ නම් පමණි.

- ❖ අනුමත වෛද්‍ය හේතූන් මත නැවත පරීක්ෂණවලට පෙනී සිටින අපේක්ෂකයන් ද නියමිත සම්පූර්ණ විභාග ගාස්තු ගෙවිය යුතු ය.

(ඈ). කිසියම් විෂයයකින්/විෂය ඒකකවලින්/පත්‍රවලින් අසමත් හෝ ඌන සාමර්ථ්‍යය හෝ ප්‍රති ඌන සාමාර්ථ්‍යය ලැබූ අපේක්ෂකයන් පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව එකී පරීක්ෂණවලට නියමිත කාලවකවානු තුළ නැවත පෙනී සිට සිය ඌනතා සම්පූර්ණ කළ යුතු වේ.

## 5. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතියට යටත්ව කිසියම් පරීක්ෂණයක ප්‍රතිඵල නිකුත් කරනු ලැබූ වහාම අන්තර්ජාලය මගින් විභාග ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු කරනු ඇත.

### ❖ උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම

උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ අදාළ වර්ෂ තුන ඉකුත් වීමෙන් පසු සියලු ම වර්ෂවල (ස්තර තුනේ ම/හතරේ ම) ප්‍රතිඵල සලකා බලා අවසන් ප්‍රතිඵල ගණනය කොට විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව ය.

## 5.1 විභාග ප්‍රතිඵල අත්හිටුවීම/තහනම් කිරීම

(අ) කිසියම් අපේක්ෂකයෙකු පිළිගත හැකි වෛද්‍යහේතු මත අදාළ පරීක්ෂණවල සියලු අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති අවස්ථාවල දී අදාළ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නා තෙක් ඔහුගේ/ඇයගේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටු වනු ලැබේ.

(ආ) කිසියම් අපේක්ෂකයෙකු විභාග අක්‍රමිකතා සඳහා දඬුවම් ලබා සිටින අවස්ථාවල දී ඔහුගේ/ඇයගේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම තහනම් කරනු ලැබේ.

## 6. ගාස්තු

විස්තර සහ අයදුම්පත් ගාස්තු රු. 1,000.00

### 6.1 පාඨමාලා ගාස්තු

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව රු. 200,000.00

විද්‍යාර්ථීන්ගේ පහසුව සඳහා මෙම ගාස්තු වාරික මගින් ගෙවීමට අවස්ථාව සලසා ඇති අතර, එය පහත සඳහන් ආකාරයට දැක්විය හැකි ය.

**ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව**
**B.B.Mgt (General) -** අවුරුදු 03

**පළමු වන වසර**

පළමුවන වාරිකය රු. 50,000.00
(ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතු ය.)

දෙවන වාරිකය රු. 45,000.00
(පළමු වසර විභාගයට පෙර ගෙවිය යුතු ය.)

| | |
|---|---|
| **දෙවන වසර** | තෙවන වාරිකය රු. 40,000.00<br>(පළමු වසර විභාගය අවසන් වී මාස දෙකකට පෙර ගෙවිය යුතු ය.)<br><br>සිව්වන වාරිකය රු. 35,000.00<br>(දෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතු ය.) |
| **තෙවන වසර** | පස්වන වාරිකය රු. 30,000.00<br>(තෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතු ය.) |

**සැ.යු.**

දැනට විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති මුදල් කිසිදු හේතුවක් මත ආපසු නොගෙවන අතර, එය පහත පරිදි අදාළ වනු ඇත.

✓ ඉහත ගාස්තුවලට අමතර ව එම විභාග සඳහා විශ්වවිද්‍යාලය විසින් නියම කරන ලබන විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය.

අමතර ගාස්තු

| | |
|---|---|
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (එක් වර්ෂයක් සඳහා) | රු. 1,500.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත (නැවත සකස් කිරීම සඳහා) | රු. 500.00 |
| විෂය නිර්දේශ පොත<br>(ව්‍යාපාර කළමනාකරණවේදී - අමතර පිටපත් සඳහා) | රු. 280.00 |
| සපයා ඇති තොරතුරු වෙනස් කිරීම සඳහා | රු. 200.00 |
| සහතිකපත්‍ර ගාස්තු | රු. 1000.00 |
| සහතිකපත්‍ර ගාස්තු (අමතර පිටපතක් සඳහා) | රු. 1000.00 |

උපාධි ප්‍රදානෝත්සව ගාස්තු - (මුල් උපාධි සහතිකපත්‍ර ගාස්තු ඇතුළත්ව)

උපස්ථිතියෙහි රු. 6,000.00
අනුපස්ථිතියෙහි රු. 5,000.00

## 7. අයදුම්පත් කැඳවීම

බාහිර උපාධි පාඨමාලාවලට ලියාපදිංචි වීමට සහ පරීක්ෂණ සඳහා පෙනී සිටීම පිණිස අයදුම්පත් කැඳවීම පුවත්පත් දැන්වීම් මඟින් සහ අන්තර්ජාලය මගින් සිදුකරනු ලැබේ. ලියාපදිංචි වීම සහ පරීක්ෂණ සඳහා අයදුම් කිරීමේ දී ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය මගින් Online ක්‍රමයට පමණක් සිදු කරනු ලැබේ. අදාළ අයදුම්පත් නියමිත කාලසීමාවේ දී ලබා ගැනීමට කටයුතු කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ.

### 7.1. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ ලිපි ලේඛන සමගින් අයදුම් පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන උපාධිය/කාරණය පැහැදිලි ව සඳහන් කොට පහත දැක්වෙන ලිපිනයට එවිය යුතු ය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
නො. 56/6,
කෝන්ගහ වත්ත පාර,
නුවර පාර,
කිරිබත්ගොඩ.

### 7.2. අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම

පහත සඳහන් හේතුන් එකක් හෝ කිහිපයක් මත අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන අයදුම් පතක් (ලියාපදිංචි හෝ පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරන) ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

I. අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම.
II. අදාළ ගාස්තු නිසිපරිදි ගෙවා නොතිබීම.
III. අයදුම්කරු විසින් පිළියෙල කරගනු ලැබූ ආකෘති පත්‍රයක් මගින් අයදුම් කර තිබීම.
IV. ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබීම.
V. ඉකුත් වර්ෂයක නිකුත් කරන ලද අයදුම්පතක් මගින් අයදුම් කර තිබීම.
VI. අදාළ තොරතුරු පැහැදිලි ව දක්වා නොතිබීම සහ දක්වා ඇති තොරතුරු තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම.
VII. නියමිත දිනට පසු අයදුම්පත් ඉදිරිපත් කිරීම.

## 8. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම

### 8.1 අත්පත්‍රිකා/මාර්ගෝපදේශ ග්‍රන්ථ

බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වන අපේක්ෂකයන් සඳහා උපරිම පහසුකම් සලසා දීමට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය මගින් නිරන්තරයෙන් ම කටයුතු කරනු ලැබේ. ඒ අනුව සිය අධ්‍යයන කටයුතු ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා මෙන් ම අදාළ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමේ දී ඇතිවන ප්‍රායෝගික දුෂ්කරතා සම්බන්ධව ද විශ්වවිද්‍යාල මහාචාර්ය, ආචාර්ය භවතුන්ගේ උපදෙස් ලබාගැනීමේ අවස්ථාව සලසා දීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු වී ඇත. මීට අමතර ව අදාළ පරීක්ෂණ සඳහා විවිධ විෂයයන්ට සහ පාඨමාලාවලට අදාළ LMS &

Zoom දේශන සහ සම්මන්ත්‍රණ ද හැඳින්විය හැකි ය. විස්තර පත්‍රිකා, සටහන්, අත්පොත් ආදිය සැපයීම කෙරෙහි ද දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි අවධානය යොමු වී ඇත.

### 8.2 උපාධි පරීක්ෂණ සඳහා සම්මන්ත්‍රණ

සියලු ම උපාධි පරීක්ෂණවලට අදාළ ව සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා බාහිර විභාග අංශය මගින් සියලු විධිවිධාන යොදනු ඇත. අදාළ සම්මන්ත්‍රණ දැනට සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වෙන අතර, ඒ සඳහා වෙනම ගාස්තුවක් ලියාපදිංචි වන අවස්ථාවේ දී හෝ ලියාපදිංචිය දීර්ඝ කරන අවස්ථාවේ දී හෝ අය කරනු ලැබේ. එක් එක් පරීක්ෂණවලට අදාළ සම්මන්ත්‍රණ සඳහා වෙන වෙන ම ගාස්තු ගෙවිය යුතු වේ. නියමිත ගාස්තු ගෙවා නැති කිසිදු අපේක්ෂකයෙකු වෙත සම්මන්ත්‍රණ/විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නොලැබේ.

### 8.3 ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය (LMS)

උක්ත පහසුකම භාවිත කිරිම සඳහා අවශ්‍යවන පරිශීලක නාමය (Username) සහ අගුල් පදය (Password) කේන්ද්‍රය විසින් සිසුන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. මෙය වෙනත් පාර්ශ්වයන් වෙත පැවරීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ.

### 8.4 පසුගිය ප්‍රශ්නපත්‍ර

කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් පෙර වර්ෂවල පවත්වන ලද පරීක්ෂණවලට අදාළ ප්‍රශ්නපත්‍ර අපගේ වෙබ් අඩවිය මගින් බාගත (Download) කර ගත හැකි ය.

එමෙන් ම පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර සහ පාඩම් මාලා LMS (Learning Management System) මගින් ලබා ගැනීමේ හැකියාව පවතී.

# 9. සහතික පත්‍ර නිකුත් කිරීම

## 9.1 සහතික නිකුත් කිරීම

ලියාපදිංචි වීමෙන් පසු ප්‍රථම/දෙවන/තෙවන වසර තුළ දී විද්‍යාර්ථීන්ට අත්‍යවශ්‍ය කාරණයකට ඉල්ලීමක් කළ පසු අධ්‍යයන වාර්තාවක් (Partial Grade Report) මුදල් ගෙවා ලබා ගත හැකි ය. අවසන් ප්‍රතිඵල නිකුත් කොට සනාතන සභාවේ අනුමැතියෙන් පසු ලබා දෙන විස්තර සහිත අධ්‍යයන සහතිකය (Academic Record) උපාධිය සමත් වන සෑම විද්‍යාර්ථියෙකු සඳහා ම ආයතනය මගින් නිකුත් කරන අතර එහි අතිරේක සහතිකය අවශ්‍ය නම් මුදල් ගෙවා ලබා ගත යුතු ය. උසස් අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍යතාව මත ලබා දෙන ලකුණු විස්තර සහිත රහස්‍ය අධ්‍යයන වාර්තාව (Academic Transcript) එම ආයතනයේ ලිපිය සමග විද්‍යාර්ථීන් විසින් ඉල්ලුම් කොට මුදල් ගෙවූ පසු එම ආයතනයට ලැබීමට සලස්වනු ඇත.

## 9.2 උපාධි සහතික නිකුත් කිරීම

උපාධි ප්‍රදානෝත්සවයෙන් අනතුරු ව නියම කර ගන්නා දිනයන් හි කැලණිය විශ්වවිද්‍යාලය මගින් උපාධි සහතික නිකුත් කරනු ලැබේ.

## 9.3. උපාධි සහතික

උපාධි පරීක්ෂණයක ප්‍රතිඵල කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ පාලකසභාව විසින් අනුමත කරනු ලැබූ පසුව උපාධි ප්‍රදානෝත්සවයේදී අදාළ උපාධි සහතික උපාධිධාරීන් වෙත නිකුත් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

### 9.4. උපාධි ප්‍රදානෝත්සවය

නියමිත උපාධි පාඨමාලා සාර්ථක ලෙස අවසන් කර ඇති සියලු ම උපාධිලාභීන් වෙත කැලණිය විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයක දී අදාළ උපාධි පිරිනැමීම සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් සියලු විධි විධාන යොදා ඇත.

### 9.5 ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සාර්ථක ලෙස සහ අදාළ නිර්ණායකවලට යටත්ව සම්පූර්ණ කරන උපාධිලාභීන් වෙත සනාතන සභාවේ අනුමැතිය පරිදි මතු සඳහන් ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙළක් දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් ක්‍රියාත්මක කොට ඇත. ඒ ඒ වර්ෂවල උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවන්හි දී මෙම ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කරනු ලැබේ.

- කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජයීය විද්‍යා පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව

i. වාණිජ විද්‍යාවේදී උපාධි පාඨමාලාව

ii. ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි පාඨමාලාව

ඒ ඒ පීඨවලට අදාළ නිර්ණායකවලට යටත්ව ඉහළ ම කුසලතා දක්වන උපාධිලාභියා වෙත ඉහත දක්වා ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ස්වර්ණ මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

## 10. වෙනත් කරුණු

සියලු ම බාහිර උපාධි අපේක්ෂකයන් දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් කරනු ලබන සියලු විමසීම්වල දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

### 10.1 පැමිණ විමසීම්

බාහිර විභාග අංශය වෙත පැමිණ ඔබට අදාළ පාඨමාලාව සම්බන්ධ තොරතුරු විමසීම් සඳහා සතියේ **බදාදා** සහ **සිකුරාදා** යන දිනයන්හි පෙ.ව.10.00 සිට 12.00 දක්වාත් ප.ව. 1.30 සිට 3.00 දක්වාත් කාලය වෙන්කර ඇත.

### 10.2 දුරකතන විමසීම්

බාහිර විභාග අංශයෙන් ඔබට අවශ්‍ය තොරතුරු දුරකතනය මගින් විමසීම් සඳහා ද සතියේ දිනවල පෙ.ව. 9.00 සිට 3.00 දක්වාත් කාලය වෙන් කර ඇත.

011 2987000

011 2987001

011 2987002

011 2987005

### 10.3 ලිඛිත විමසීම්

බාහිර විභාග අංශයේ ඔබට අදාළ බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ ව හෝ අදාළ පරීක්ෂණ සම්බන්ධ ව ලිඛිත ව කරුණු විමසීමේ දී මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද ලිපියකින් අදාළ විමසීම් කළ යුතු අතර, එවැනි විමසීම් සඳහා පිළිතුරු එවීම පිණිස නියමිත වටිනාකමින් යුත් මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද එවිය යුතු ය.

ලිඛිත විමසීම් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කාරණය ඉතා පැහැදිලි ව සටහන් කළ යුතු වේ.

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් කරනු ලබන ලිඛිත විමසීමක් සඳහා ආදර්ශ ආකෘති පත්‍රය**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
නො. 56/6,
කෝන්ගහවත්ත පාර,
නුවර පාර, කිරිබත්ගොඩ.

1. නම :- ........................................................................................................

ලිපිනය :- ........................................................................................................

2. ශිෂ්‍ය අංකය :- ........................................................................................

3. විභාග අංකය :- ......................................................................................

4. කාරණය :- ..............................................................................................

(ඉතා කෙටියෙන් සඳහන් කරන්න.)

5. අමුණා ඇති ලේඛනඃ- ..................................................................................

දිනය :- ...................................

ශිෂ්‍යයාගේ දුරකතන අංකය :- ......................................................

ශිෂ්‍යයාගේ අත්සන :- ............................................

**යෝජනා සහ පැමිණිලි**

ඔබගේ අදහස්, යෝජනා සහ පැමිණිලි ඇත්නම්, ඒ සියල්ල පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,**
**නො. 56/6,**
**කෝන්ගහවත්ත පාර, නුවර පාර,**
**කිරිබත්ගොඩ.**

E-mail:- **cdce@kln.ac.lk**
Web site :-***www.cdce.kln.ac.lk***

## 11. බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි

- ❖ බාහිර උපාධි පාඨමාලාවලට අදාළ ව පෞද්ගලික උපකාරක පන්ති/ආයතනවල ඉගැන්වීම් කටයුතු කරන කිසිදු ආචාර්යවරයකු ප්‍රශ්නපත්‍ර සකස් කිරීමේ හෝ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමේ හෝ කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගී කර ගනු නොලැබේ.

- ❖ බාහිර උපාධි පාඨමාලා සඳහා පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වෙන කිසිදු ආයතනයකට කැලණිය විශ්වවිද්‍යාලයීය දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය යටතේ ලියාපදිංචි ආයතනයක් වශයෙන් හෝ අනුබද්ධ ආයතනයක් වශයෙන් හෝ කටයුතු කිරීමට අයිතියක් ලබා දී නොමැත.

සියලු ම බාහිර උපාධි අපේක්ෂකයන් මෙම ශිෂ්‍ය අත්පොතෙහි සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතු අතර අදාළ උපාධි පාඨමාලාව හදාරා අවසන් වන තුරු මෙම අත්පොත සුරැකිව තබා ගන්නා ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

**මෙම අත්පොතෙහි සඳහන් ඕනෑ ම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ සම්පූර්ණ අයිතිය කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ.**

**කැලණිය විශ්වවිද්‍යාලයීය දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ප්‍රකාශනයකි.**